# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 65 — 1973 ජූනි 22 වැනි සිකුරාදා — 1973.06.22

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් සංඛ්‍යාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 759 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 773 |
| නිරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 771 | රථ සීමා විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 771 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොටුපල් වෙන්දේ හා වෙනත් වෙන්දේ විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 773 |


**සැලකිය යුතුයි.**—(i) ශ්‍රී ලංකා පදනම් පනත් කෙටුම්පත 1973 ජූනි 08 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී. (ii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ හා උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් ද පළවේ.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

ශල්‍යාගාරයට අවශ්‍ය උපකරණ සැපයීම

කොළඹ 2, තැ. පෙ. 594, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූලි මස 12 වෙනි දින පෙරවරු 10 තෙක් පහත සඳහන් සැපයීම් සඳහා වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

1. තුවා ජී. එස්. 500 යි
2. සර්ජන් ගවුන් 200 යි
3. කලිසම් පිජාමා 50 යි
4. ඇතිරිලි (ඩ්‍රෝ ෂීට්ස්) 50 යි
5. හෙදි ගවුන් 30 යි
6. මාස්ක් (මුහුණු ආවරණ) 50 යි
7. හිස් වැසුම් (පිරිමි) 50 යි
8. හිස් වැසුම් (ගැහැණු) 50 යි.

ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1973 ජූලි මස 11 දින දවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. මෙකී සැපයීමට අදාල "සාම්පල්" මෙම මූලස්ථානයේ ටෙන්ඩර් අංශයේදී පරීක්ෂා කර බැලිය හැක.

වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති.

6–775—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

**සැලකිය යුතුයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පුත්තලම් දිස්ත්‍රික්කයේ තබ්බෝවේ කැළෑ යන්ත්‍රානුසාරයෙන් එළිකිරීම

මුල් ගැලවීම, කාණු වෙන්කිරීම, මුල් පිළිස්සීම, සමතලා කිරීම, අනවශ්‍ය දෑ අස් කිරීම හා නියර දැමීම ඇතුලුව පහත සඳහන් ප්‍රදේශයෙහි යන්ත්‍රානුසාරයෙන් කැළෑ එළිකිරීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැන විසින් 1973 ජූලි මස 6 වැනි දින පෙරවරු 11.00 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| දිස්ත්‍රික්කය | ව්‍යාපාරය | ආසන්නතම වපසරිය අක්කර |
|---|---|---|
| පුත්තලම ... | තබ්බෝව ... ... | 250 |

2. ඒ ඒ දිස්ත්‍රික්කයන්හි දිසාපති කාර්යාලයේ මානක නිලධාරි තැන හෝ දිසාපතිගේ නියෝජිතයෙකු විසින් එළිකළ යුතු කොටස්වල මායිම් පෙන්වන අතර එම මායිම් නොඉක්ම විය යුතුයි. බිම් කොටස්වල මායිම් සැලැස්මේ හා භූමියෙහි දක්වීමෙන් පසුව එයින් පිටස්තර වශයෙන් කිසිවක් නොකළ යුතු අතර ගෙවීම් කරනු ලබන්නේ මායිම් තුළ කළ වැඩට පමණකි.

3. මෙම කාර්යාලයට හෝ ලංකා බැංකුවේ (යෝක් වීදිය කාර්යාලයේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකගේ ගිණුමට හෝ කොළඹින් පිටත, දිසාපති කාර්යාලයට හෝ රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කොළඹ 1, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකගෙන් 1973 ජූලි මස 5 වැනි දින දවල් 12 වන තෙක් ලබාගත හැකි ආකෘතිවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ " පුත්තලම් දිස්ත්‍රික්කයේ තබ්බෝව ව්‍යාපාරයෙහි යන්ත්‍රානුසාරයෙන් කැළෑ එළි කිරීම සඳහා ටෙන්ඩර් " යනුවෙන් සඳහන් කොට කොළඹ 1, එව්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම් පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ යුතුයි.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් භාරගෙන අවසන් වූ දින සිට දින 30 ක් යන තෙක් ඒවා ආපසු නොගත යුතුය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට තෙමසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

7. ඇපයක් ඉදිරිපත් කොට පොරොන්දු පත්‍රය අත්සන් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට සාර්ථක වූ ටෙන්ඩර්කරු අසමත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වීමටද හේතු වන්නේය. එවැන්නන්ට රජයේ කොන්ත්‍රාත් දෙනු නොලැබේ.

8. කොළඹ 1, එව්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1973 ජූලි 6 වැනි දින පෙරවරු 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේ දී පෙනී සිටිය හැක.

9. තෝරා ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් විසින් අත්සන් කළ යුතු ගිවිසුම් පත් ආකෘති ප්‍රදේශයේ දිසාපතිගෙන් ලබාගෙන පරීක්ෂාකාරීව කියවා බලා, යම්කිසි කරුණක් පැහැදිලි කරවා ගැනීමට අවශ්‍ය වුවහොත් දිසාපති කාර්යාලයෙන් එය පැහැදිලි කරවා ගත යුතුයි.

10. යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීට සහ ටෙන්ඩරයක යම්කිසි කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුවන අතර ඒ ගැන ප්‍රශ්න කළ නොහැක.

11. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් අදල දිස්ත්‍රික්කයේ දිසාපති සමඟ කොන්ත්‍රාත්තුවක් අත්සන් කළ යුතුයි.

12. විධිමත් පරිදි බලය නොලබා කොන්ත්‍රාත්තුවක් වෙනත් කෙනෙකුට පැවරීම හෝ බදුදීම නොකළ යුතුයි. කොන්ත්‍රාත්කරු විසින් ඔහු වෙනුවට කොන්ත්‍රාත්තුව කරගෙන යාම වෙනත් කෙනෙකුට බලය පවරමින් නිකුත් කරන ලද ඇටෝර්නි බලයක් ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිය රජය සතුවේ.

13. යම්කිසි හේතුවක් නිසා කොන්ත්‍රාත්කරු විසින් සේවයේ නොයෙද විය යුතු පුද්ගලයකු සිටී නම් දිසාපති විසින් ඒ ගැන කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දන්විය යුතු අතර කොන්ත්‍රාත්කරු විසින් එබඳු පුද්ගලයකු සේවයේ නොයෙදවිය යුතුයි.

14. රජයේ කොන්ත්‍රාත්තුවක් මීට පෙර කර නැති ටෙන්ඩර්කරුවෙකු විසින් ටෙන්ඩර් ආකෘති ඉල්ලුම් කරන විට තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය සහ තමන්ට අයත් ඉඩකඩම් හෝ වෙනත් දේපල තිබෙන දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්ක සඳහන් ලිඛිත ප්‍රකාශයක් ආකෘති නිකුත් කරන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු යි. ඉඩකඩම්වල වපසරිය සහ වෙනත් දේපලවල ස්වභාවය හා ප්‍රමාණය සඳහන් කළ යුතුයි. වෙනත් දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් කර ඇති ටෙන්ඩර් කරුවකු විසින් එම දෙපාර්තමේන්තුවේ නම සහ වැඩය කළ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුයි.

15. ටෙන්ඩර් කරුවන් විසින් තැන්පත් මුදල් සඳහා ලබාගත් කුවිතාන්සි සුරක්ෂිතව තබාගෙන එම මුදල් ආපසු ඉල්ලන විට එකී කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි. එම කුවිතාන්සි ටෙන්ඩර්වලට නොඇමිණිය යුතුයි.

16. ටෙන්ඩර් ආකෘති ආදිය ලබාගැනීමෙන් පසුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයගේ තැන්පත් මුදල් ආපසු ගෙවීම කරනු ලබන්නේ ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ නියමිත වේලාවට පෙර ඔවුන් විසින් ආකෘති ආපසු එව්වොත් පමණකි.

17. වැඩි විස්තර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක.

යූ. ඒ. ගුණරත්න,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇව්ලන් චතුරශ්‍රය,
කොළඹ 1.
1973 ජූනි 12 වැනි දින.
සිටී/1/476

6–777—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධක දෙපාර්තමේන්තුව

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ කැළෑ යන්ත්‍රානුසාරයෙන් එළිකිරීම

මුල් ගැලවීම, කාණු වෙන්කිරීම, මුල් පිළිස්සීම, සමතලා කිරීම, අනවශ්‍ය දෑ අස් කිරීම හා නියර දැමීම ඇතුළුව පහත සඳහන් ප්‍රදේශයෙහි යන්ත්‍රානුසාරයෙන් කැළෑ එළිකිරීම සඳහ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂක තැන විසින් 1973 ජූලි 6 වැනි දින පෙරවරු 11.00 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| දිස්ත්‍රික්කය | ව්‍යාපාරය | ආසන්නතම වපසරිය අක්කර |
|---|---|---|
| හම්බන්තොට ... | මූරුතවෙල ... | 1,000 |

2. ඒ ඒ දිස්ත්‍රික්කයන්හි දිසාපති කාර්යාලයේ මානක නිලධාරි තැන හෝ දිසාපතිගේ නියෝජිතයෙකු විසින් එළිකළ යුතු කොටස් වල මායිම් පෙන්වන අතර එම මායිම් නොඉක්මවිය යුතුයි. බිම් කොටස්වල මායිම් සැලැස්මේ හා භූමියෙහි දක්වීමෙන් පසුව එයින් පිටස්තර වශයෙන් කිසිවක් නොකළ යුතු අතර ගෙවීම් කරනු ලබන්නේ මායිම් තුළ කළ වැඩට පමණකි.

3. මෙම කාර්යාලයට හෝ ලංකා බැංකුවේ (යෝක් වීදිය කාර්යාලයේ) ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකගේ ගිණුමට හෝ කොළඹින් පිටත, දිසාපති කාර්යාලයට හෝ රු. 200 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කොළඹ 1, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂකගෙන් 1973 ජූලි 5 වැනි දින දවල් 12.00 වන තෙක් ලබාගත හැකි ආකෘතිවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් බහාලූ ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මූරුතවෙල ව්‍යාපාරයෙහි යන්ත්‍රානුසාරයෙන් කැළෑ එළි කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ 1, එව්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියා පදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාර දීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ යුතුයි.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන් ම කිසියම් වෙනස් කිරීමකට අදල නොවිය යුත්තේ ය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් භාරගෙන අවසන් වූ දින සිට දින 30 ක් යන තෙක් ඒවා ආපසු නොගත යුතුය.

6. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට තෙමසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

7. ඇපයක් ඉදිරිපත් කොට පොරොන්දු පත්‍රය අත්සන් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට සාර්ථක වූ ටෙන්ඩර්කරු අසමත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වීමටද හේතු වන්නේය. එවැන්නන්ට රජයේ කොන්ත්‍රාත් දෙනු නොලැබේ.

8. කොළඹ 1, එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1973 ජූලි 6 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. තෝරා ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් විසින් අත්සන් කළ යුතු ගිවිසුම්පත් ආකෘති ප්‍රදේශයේ දිසාපතිගෙන් ලබාගෙන පරික්ෂාකාරීව කියවා බලා, යම් කිසි කරුණක් පැහැදිලි කරවා ගැනීමට අවශ්‍ය වුවහොත් දිසාපති කාර්යාලයෙන් එය පැහැදිලි කරවා ගත යුතුයි.

10. යම් කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීම සහ ටෙන්ඩරයක යම් කිසි කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතු වන අතර ඒ ගැන ප්‍රශ්ණ කළ නොහැක.

11. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් අදළ දිස්ත්‍රික්කයේ දිසාපති සමඟ කොන්ත්‍රාත්තුවක් අත්සන් කළ යුතුයි.

12. විධිමත් පරිදි බලය නොලබා කොන්ත්‍රාක්තුවක් වෙනත් කෙනෙකුට පැවරීම හෝ බදු දීම නොකළ යුතුයි. කොන්ත්‍රාත් කරු විසින් ඔහු වෙනුවට කොන්ත්‍රාත්තුව කරගෙනයෑම වෙනත් කෙනෙකුට බලය පවරමින් නිකුත් කරන ලද ඇටෝර්නි බලයක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුවේ.

13. යම්කිසි හේතුවක් නිසා කොන්ත්‍රාත්කරු විසින් සේවයේ නොයෙද විය යුතු පුද්ගලයෙකු සිටී නම් දිසාපති විසින් ඒ ගැන කොන්ත්‍රාත්කරු වෙත ලිඛිතව දන්විය යුතු අතර කොන්ත්‍රාත්කරු විසින් එබඳු පුද්ගලයකු සේවයේ නොයෙදවිය යුතුයි.

14. රජයේ කොන්ත්‍රාත්තුවක් මීට පෙර කර නැති ටෙන්ඩර්කරුවෙකු විසින් ටෙන්ඩර් ආකෘති ඉල්ලුම් කරන විට තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය සහ තමන්ට අයත් ඉඩකඩම් හෝ වෙනත් දේපල තිබෙන දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්ක සඳහන් ලිඛිත ප්‍රකාශයක් ආකෘති නිකුත් කරන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම්වල වපසරිය සහ වෙනත් දේපලවල ස්වභාවය හා ප්‍රමාණය සඳහන් කළ යුතුයි. වෙනත් දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් කර ඇති ටෙන්ඩර් කරුවකු විසින් එම දෙපාර්තමේන්තුවේ නම සහ වැඩය කළ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුයි.

15. ටෙන්ඩර් කරුවන් විසින් තැන්පත් මුදල් සඳහා ලබාගත් කුවිතාන්සි සුරක්ෂිතව තබාගෙන එම මුදල් ආපසු ඉල්ලන විට එකී කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුයි. එම කුවිතාන්සි ටෙන්ඩර්වලට නොඇමිණිය යුතුයි.

16. ටෙන්ඩර් ආකෘති ආදිය ලබා ගැනීමෙන් පසුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයගේ තැන්පත් මුදල් ආපසු ගෙවීම කරනු ලබන්නේ ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ නියමිත වේලාවට පෙර ඔවුන් විසින් ආකෘති ආපසු එව්වොත් පමණකි.

17. වැඩි විස්තර ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක.

යූ. ඒ. ගුණරත්න,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
ඇච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1.
1973 ජූනි මස 12 වැනි දින.
සිවී/1/474.

6–776—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුව

### රබර් බේල් ප්‍රවාහනය කිරීම

1973 සැප්තැම්බර් මස 1 වැනි දින සිට 1974 අගෝස්තු 31 වැනි දින දක්වා වූ කාලය තුළදී ගාල්ලේ මාගාල්ලේ මාතර පාරේ අංක 304/1 දරණ ස්ථානයේ පිහිටි දෙපාර්තමේන්තුවේ මිටි බැඳීමේ මධ්‍යස්ථානයේ සිට ගාල්ලේ වාප්පුව දක්වා එකක් රාත්තල් 250 බැගින් වූ ෂීට් රබර් බේල් ප්‍රවාහනය කිරීම සඳහා ලොරි 10ක් හෝ ඊට වැඩි ගණනක් ඇති ප්‍රවාහන කොන්ත්‍රාත් කරුවන්ගෙන් මිළ ගණන් 1973 අගෝස්තු 10 වැනි දින පෙ. ව. 10 දක්වා වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ.

2. ප්‍රවාහන සේවාවන් අවශ්‍ය වන්නේ වාප්පුවේදී රබර් බේල් නැව්වලට පටවනු ලබන අවස්ථාවලදීත් දෙපාර්තමේන්තු ප්‍රවාහන සේවාවන් නොමැති අවස්ථාවලදීත්, පමණකි.

3. සියලුම වැඩ කරන දිනවලදීත්, රජයේ නිවාඩු දිනවලදීත් දිවා හා/හෝ රාත්‍රී කාලයන් තුළදී කෙටි කාලීන දැන්වීම් අනුව මෙම සේවාවන් සැපයීමට සාර්ථකවන ටෙන්ඩර්කරු සූදානමින් සිටිය යුතුය.

4. කිසිම හේතුවක් නොදන්වා සම්පූර්ණ වර්ෂය වෙනුවෙන් හෝ ඉන් කොටසක් වෙනුවෙන් හෝ ඉදිරිපත් කරන ලද මිළ ගණන් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමට හෝ ඉන් එකක් හෝ සියල්ලම හෝ පිළිගැනීමට හෝ වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ කොමසාරිස්ට බලය ඇත.

5. පසුව ආපසු ගෙවනු ලබන රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් දෙපාර්තමේන්තුවේ තැන්පත් කිරීමෙන් පසුව ලබා ගත හැකි ටෙන්ඩර් ආකෘතිවල දෙපිටපතකින් යුක්තව පිළියෙල කරන ලද මිළ ගණන් 1973 අගෝස්තු 10 වැනි දින පෙරවරු 10 ට පෙර ලැබෙන පරිදි කොළඹ 1, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ 5 වැනි මහලේ අංක 147 දරණ තැපැල් පෙට්ටිය හිමි වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ලැබෙන පරිදි ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීම හෝ දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ යුතුය. ලියුම් කවරයේ වම් පස උඩ කෙළවරේ "ගාල්ල මිටි බැඳීමේ මධ්‍යස්ථානයේ සිට ගාල්ලේ වාප්පුව දක්වා ෂීට් රබර් බේල් ප්‍රවාහනය කිරීම සඳහා මිළ ගණන්" යනුවෙන් පැහැදිලිව ලිය යුතුය.

6. මිළ ගණන් පහත දැක්වෙන පරිදි විකල්ප ක්‍රම දෙකෙන්ම හෝ ඉන් එකකින් එවිය යුතු අතර ඉන් එකක් පමණක් පිළිගනු ලැබේ.

| | රු. ශ. |
|---|---|
| (අ) (i) එකක් රාත්තල් 250 බැගින් වූ රබර් බේල් එකක් ගාල්ල මිටි බැඳීමේ මධ්‍යස්ථානයේ සිට ගාල්ල වාප්පුවට ප්‍රවාහණය කිරීමට ගාස්තුව ... ... | |
| (ii) එකක් රාත්තල් 250 බැගින් වූ රබර් බේල් එකක් නැවට භාර නොගැනීමේ හේතුව උඩ වාප්පුවේ සිට නැවත මිටි බැඳීමේ මධ්‍යස්ථානයට ප්‍රවාහනය කිරීමට ගාස්තුව ... | |
| (iii) නැව් බඩු නැවට භාර නොගැනීමේ හේතුව උඩ වාප්පුවේදී ලොරි ප්‍රමාද වන අවස්ථාවලදී, ලොරියකට පැයකට අය කරනු ලබන අතිරේක ගාස්තුව ... ... | |
| (ආ) (i) පෙරවරු 8 සිට පස්වරු 5 දක්වා ගාල්ල මිටි බැඳීමේ මධ්‍යස්ථානයට සපයනු ලබන ලොරියකට අයකරනු ලබන ගාස්තුව ... | |
| (ii) පස්වරු 5 සිට පස්වරු 8 දක්වා වාප්පුවේදී ප්‍රමාද වෙන ලොරියකට පැයකට අයකරනු ලබන ගාස්තුව ... ... | |
| (iii) පස්වරු 8 සිට පසුදා පෙරවරු 8 දක්වා වාප්පුවේදී ප්‍රමාද වෙන ලොරියකට පැයකට අයකරනු ලබන ගාස්තුව ... | |

#### 6අ (iii) ඡේදයට අදාළ සටහන

(i) "අතිරේක ගාස්තු" යන්නෙන් සාමාන්‍ය වරාය ප්‍රමාදයන් අදහස් හෝ ඊට එවැනි ප්‍රමාදයන් ඇතුළත් නොවන අතර, එම ගාස්තු නැවට භාර නොගනු ලබන නැව් බඩු සම්බන්ධයෙන් නැව් ඒජන්තවරුන් විසින් දෙපාර්තමේන්තුවට ගෙවනු ලබන ගාස්තුවලට අදාල පැය ගණනට සීමා වේ.

(ii) වාප්පුවේ සිට ගාල්ලේ මිටි බැඳීමේ මධ්‍යස්ථානයට නැවත ප්‍රවාහනය කරන ලද නැව් බඩු වෙනුවෙන් අතිරේක ගාස්තු නොගෙවනු ලබන අතර, එවැනි අවස්ථාවලදී නැවත ප්‍රවාහනය කිරීමේ ගාස්තු පමණක් ගෙවනු ලැබේ.

7. 6(අ) වැනි ඡේදයෙහි සඳහන් කොන්දේසි පිළිගනු ලැබුව හොත් මෙම සේවාව වෙනුවෙන් සඳහන් කරන ලද අතිරේක ගාස්තු හැරෙන්නට වෙනත් කිසිම ක්‍රමයක ප්‍රමාද ගාස්තුවක් කොන්ත්‍රාත් කරුට නොගෙවනු ලැබේ.

8. ප්‍රවාහනය කරන කාලය තුළදී රබර් තොගය නැතිවීමක් හෝ ඊට පැමිණෙන යම් හානියක් වෙනුවෙන් යම් වන්දි ඉල්ලීමක් වේ නම් එය සාර්ථක වන ටෙන්ඩර්කරුගේ වගකීම වන්නේ ය.

9. මෙම ප්‍රවාහන සේවාව කරගෙන යාම සඳහා සාර්ථක වන ටෙන්ඩර්කරු රුපියල් 2,000 ක බැංකු ඇපකරයක් ඉදිරිපත් කර දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට එළඹිය යුතුය.

10. කොන්ත්‍රාත්කරුගේ ! කිසියම් සේවකයෙකු විසින් හෝ වෙනුවෙන් වන්දි ඉල්ලා සිටීමේ ප්‍රශ්නයක් පැනනැගුනහොත් 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥපනත (117 පරිච්ඡේදය)

හා ඒ පිළිබඳ අනිකුත්, නොතීසි සංශෝධන හා නිවේදන යටතේ ඇති වගකීම් වලින් කොන්ත්‍රාත්කරු මෙම දෙපාර්තමේන්තුව නිදහස් කළ යුතුය.

11. මෙම සේවාව සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන කම්කරුවන් පමණක් යෙදවිය යුතුය. යම් කම්කරුවෙකු නොමනා පුද්ගලයෙකු බව වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්ට පෙනීගියහොත් එම කම්කරුවා සේවයේ රඳවා ගැනීමට විරුද්ධවීමට ඔහුට හැකි වෙන අතර, සාර්ථක වන ටෙන්ඩර්කරු එම කම්කරුවාගේ සේවය නතර කිරීමට වහාම කටයුතු කළ යුතුය.

12. කොන්ත්‍රාත්තුවට අදාල සම්පූර්ණ කාලය සඳහා ප්‍රවාහනය කිරීමට නියමිත නැව්බඩු ප්‍රමාණය වෙනුවෙන් සම්පූර්ණ රක්‍ෂණය සාර්ථක වන ටෙන්ඩර්කරු විසින් ලබා ගත යුතුය.

13. කොළඹ 1, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ 5 වැනි මහලේ ඇති මගේ කාර්යාලයේදී 1973 අගෝස්තු 10 වැනි දිනදී පෙරවරු 10 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී කැමති ටෙන්ඩර් කරුවනට ඒ සඳහා පෙනී සිටිය හැකිය.

14. වැඩිමනත් විස්තර කොළඹ 1, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ 5 වැනි මහලේ ඇති වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඇම්. සී. සී. ප්‍රනාන්දු,
වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්.

වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 147,
5 වැනි මහල,
තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973 ජූනි 22 දින.

6–846—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවය

### කලාවැව කොටස (මහඉලුප්පල්ලම)

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කළාවැව කොටසේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් උතුරු මැද දිසාවේ වැඩ අධ්‍යක්ෂ තැන විසින් 1973 ජූලි මස 6 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එදින එවේලේම එහිදී සිදු කෙරේ.

| | වැඩයේ නම | කොන්ත්‍රාත්කරු ලියාපදිංචි විය යුතු ගණන | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|---|
| 1. | අංක 8 තුලානේ මහ තිඹිරිවැව වැඩිදියුණු කිරීම ... ... | රු. 20,000 හෝ ඊට වැඩි ... | රු. 25 |
| 2. | අංක 8 තුලානේ බොරවැව වැඩි දියුණු කිරීම ... ... | රු. 35,000 හෝ ඊට වැඩි ... | රු. 50 |
| 3. | අංක 10 තුලානේ ගැටදිවුල වැව වැඩි දියුණු කිරීම ... ... | රු. 40,000 හෝ ඊට වැඩි ... | රු. 50 |
| 4. | අංක 11ඒ තුලානේ වරාවැව වැඩි දියුණු කිරීම ... ... | රු. 20,000 හෝ ඊට වැඩි ... | රු. 25 |

2. වාරිමාර්ග හා මහාමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, කම්කරු සමිතිවලට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මේ සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැක.

3. 1973 ජූලි මස 3 වැනි දින දක්වා කළාවැව කොටස (මහඉලුප්පල්ලම) මරදන්කඩවල, කැකිරාව, අනුරාධපුර සහ නොච්චියගම විධායක ඉංජිනේරු කාර්යාලවලින් කාර්යාල වේලාවලදී ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර්කිරීම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන්ගේ ලියා පදිංචි පොත් සහ දනට කරගෙන යන වැඩ සහ ඒවායේ වටිනාකම් දක්වෙන ප්‍රකාශනයන්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලබා දිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා විධායක ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ඉදිරිපත් කිරීමට පෙර මෙම වැඩය සඳහා සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ඉහත කී විධායක ඉංජිනේරු කාර්‍යාලවලදී හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

4. මෙම වැඩය ගැන සියලුම විස්තර, සැලසුම් ආදිය කාර්යාල වේලාවන් තුළදී කළාවැව කොටස (මහඉලුප්පල්ලම) විධායක ඉංජිනේරු කාර්‍යාලයෙන් ලබාගත හැක.

වී. රෙගුනාදන්,
විධායක ඉංජිනේරු, කළාවැව කොටස.

1973.06.07 වැනි දින,
කලාවැව විධායක ඉංජිනේරු කාර්‍යාලය,
මහඉලුප්පල්ලම.

6–790—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ රජයේ ගොවිපලේ හොඳින් ඉදුනු මිරිස් කරල් සහ ඉදුන තක්කාලි ගෙඩි කැඩීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් ගොවිපලේ හොඳින් ඉදුනු මිරිස් කරල් කැඩීම සහ ඉදුනු තක්කාලි ගෙඩි කැඩීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1973. 7. 5 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

ගොවිපලේ වගාකර ඇති අක්කර 40 ක පමණ වූ ඇම්. අයි. හයිබ්‍රිඩ් වර්ගයේ මිරිස් වගාවේ ඉදුනු මිරිස් කරල් පමණක් හා අක්කර 30 ක පමණ වූ තක්කාලි වගාවේ ඉදුනු ගෙඩි කඩා භාරදීම සඳහා පහත සඳහන් කොන්දේසි යටතේ ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය :—

(i) අක්කර ගණනට හෝ කඩන ඉදුනු මිරිස් කරල් හා තක්කාලි ගෙඩි රාත්තල් ගණනට හෝ මිල ගණන් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

(ii) ටෙන්ඩර් කරු විසින් ගොවිපලේ රාජකාරි වේලාවන් තුල පමණක් ඉදුනු මිරිස් හා තක්කාලි ගෙඩි කැඩීමට එකඟ විය යුතුය.

(iii) 1973. 7. 15 වැනි දින පමණ මිරිස් කැඩීම ආරම්භ කළ යුතු අතර 1973. 8. 1 පමණ තක්කාලි කැඩීම ආරම්භ කළ යුතුය. මෙම දිනයන් සාමාන්‍යයෙන් කාලය පෙන්නුම් කිරීමක් වන අතර නිශ්චිත වශයෙන් කැඩීම ආරම්භ කළ යුතු දිනයන් සඳහා ගොවිපල අධිකාරිගෙන් උපදෙස් ලබා ගත යුතුය. තවද ආරම්භ කළ යුතු දිනය ඉහත දක්වා ඇති දිනයට දවස් 15 කට පෙර හෝ පසුව හෝ විය හැකිය.

(iv) ටෙන්ඩර්කරු විසින් දිනපතා තමන් වැඩට යොදවන අයගේ නම් සහ ප්‍රමාණයන් ගොවිපල අධිකාරි වෙත එක් එක් දිනවලදී දැන්විය යුතුය.

(v) අක්කර ප්‍රමාණය අනුව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නේ නම් එක් අක්කරයක ඉදුනු මිරිස් හා තක්කාලි කැඩීමේ වාර ගණන, ගොවිපල අධිකාරි ගේ අවශ්‍යතාවය අනුවත්, කැඩීමට සිදුවන වාර ගණන අනුවත්, වෙනස් වෙයි. එබැවින් එක් අක්කරයකට ඉදිරිපත් කරන මිල ගණන සම්පූර්ණ අස්වැන්න නෙලා අවසන් කිරීම දක්වා විය යුතුය.

(vi) රාත්තල් ගණනට මිල ගණන් ඉදිරිපත් කරන්නේ නම් හොඳින් ඉදුනු මිරිස් කරල් සහ තක්කාලි ගෙඩි පමණක් කඩා කිරා භාර ගැනීම සඳහා ගබඩාවට භාර දිය යුතු අතර, කඩන මිරිස්වල සහ තක්කාලි වල තත්වය ගැන ගොවිපල අධිකාරි සෑහීමකට පත්වන අයුරු විය යුතුය. අවශ්‍ය උපදෙස් ගොවිපල අධිකාරිගෙන් විමසා කැඩීම ආරම්භ කළ යුතුය.

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා පේරාදෙණිය ගන්නොරුවේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූලි මස 12 වැනි දින ප.ව. 2.30 දක්වා මිල ගණන් භාරගනු ලැබේ :—

| ද්‍රව්‍ය අංක | විස්තර | | ප්‍රමාණය | |
|---|---|---|---|---|
| 1. (අ) | ගඩොල් | | 20,000යි | ජහසලක ට්‍රැක්ටර් මධ්‍යස්ථානයට සැපයීමට හා ගෙනගොස් භාර දීමට |
| (ආ) | ගංගාවැලි | කියුබ් | 7යි | |
| (ඇ) | තම්බාපු හුණු | බුසල් | 75යි | |
| (ඈ) | සක්කගල් 6'' × 9'' | කියුබ් | 3යි | |
| (ඉ) | කැට ගල් 3/4" | කියුබ් | 1යි | |
| 2. | පලමුවන පන්තියේ දැව— | | | |
| (අ) | 4'' × 2'' දිග 10 | | 10යි | |
| (ආ) | 4'' × 2'' දිග 13 | | 15යි | |
| (ඇ) | 4'' × 2'' දිග 8 | | 15යි | |
| (ඈ) | 4'' × 3'' දිග 7 | | 15යි | |
| (ඉ) | $1\frac{1}{8}$ × 9 දිග 7 ලෑලි හතරැස් අඩි | | 200යි | |
| 3. (අ) | මල නොබැඳෙන තීන්ත රතු | ගැළුම් | 7යි | සැපයීමට පමණයි. |
| (ආ) | ඇළුමිනියම් තීන්ත | ,, | 3යි | |
| (ඇ) | ඇණමල් තීන්ත (ක්‍රීම්) | ,, | 6යි | |
| (ඈ) | වෙල්ඩඩ් මෙෂ් $1\frac{1}{2}$'' × $1\frac{1}{8}$ හතරැස් අඩි | | 350යි | |
| (ඉ) | රැග් බෝල්ට් යකඩ 1—9'' × 5/8'' | | 60යි | |
| (ඊ) | 1/2'' ඝන පැතැලි යකඩ හතරැස් අඩි | | 50යි | |
| (උ) | 1/2'' × 2 දිග ඇණ සහ මුරච්චි | | 60යි | |
| (ඌ) | 5'' ජී.අයි. කොකු ඇණ, මුරච්චි හා පෙති සමඟ | | 250යි | |
| (එ) | $2\frac{1}{2}$'' × 2 1/2'' × 1/4'' කෝන යකඩ දික් අඩි | | 700යි | |
| (ඒ) | පදම් කල වානේ ජොයිස්ට් 4'' × 5'' × 12 දිග | | 12යි | |
| 4. (අ) | විදුලි බලයෙන් ක්‍රියාකරන සීලිං පැන් 56'' ස්විප්ස් වෝල්ට්ස් 220/230 ඒසී සයිකල්ස් රෙගුලේටරය හා එල්ලන බට, පුලිය හා පින් සහිත අංග සම්පූර්ණ | | 3යි | |
| (ආ) | ඇම්පියර් 30 මේන් සුවිච් | | 1යි | |
| (ඇ) | ඇම්පියර් 5 ටම්බ්ලර් සුවිච් | | 10යි | |
| (ඈ) | පී.වී.සී. වයර් 1/044 තනිවයර් | රෝල් | 5යි | |
| (ඉ) | පී.වී.සී. වයර් 7/036 තනිවයර් | රෝල් | 1යි | |
| (ඊ) | බේක් ලයිට් සීලිං රෝසස් | | 6යි | |
| (උ) | බේක් ලයිට් සී.ජී. හෝල්ඩර්ස් | | 6යි | |
| (ඌ) | බේක් ලයිට් බැටන් හෝල්ඩර්ස් | | 4යි | |
| (එ) | ටියුබ්ස් ස්ටාටර් සහිත අඩි 4 වොට්ස් 40 අංග සම්පූර්ණ ෆ්ලොරසන්ට් ලාම්පු ට්වින් ටයිප් | | 6යි | |
| 5. (අ) | $\frac{1}{2}$'' ජී. අයි. පයිප්ප | දික් අඩි | 150යි | |
| (ආ) | $\frac{3}{4}$'' ජී. අයි. පයිප්ප | | 100යි | |
| (ඇ) | $\frac{1}{2}$'' ජී. අයි. බෙන්ඩ්ස් | | 20යි | |
| (ඈ) | $\frac{3}{4}$'' ජී. අයි. බෙන්ඩ්ස් | | 10යි | |
| (ඉ) | $\frac{3}{4}$'' ජී. අයි. සමාන ටී | | 10යි | |
| (ඊ) | $\frac{1}{2}$'' ජී. අයි. සමාන ටී | | 10යි | |
| (උ) | $\frac{3}{4}$'' × $\frac{1}{2}$'' ජී. අයි. අඩුකිරීමේ සොකට් | | 10යි | |
| (ඌ) | $\frac{3}{4}$'' × $\frac{1}{2}$'' ජී. අයි. අඩුකිරීමේ ටී | | 10යි | |
| (එ) | 2'' ජී.අයි. බෙන්ඩ්ස් | | 3යි | |
| (ඒ) | 1/2'' ජී.අයි. රනින් ජොයින්ට් දික් අඩි | | 5යි | |
| (ඔ) | කෙලාසෙට් ස්කෝට්ං ටයිප්, හයිලෙවල් සිස්ටර්න්, ඩවුන් පයිප්ප, ට්‍රැප්, බ්‍රැකට් ආදිය සමඟ අංග සම්පූර්ණ | | 3යි | |
| (ඕ) | ගැළුම් 600ක් අල්ලන ජී.අයි. 16 බී.ඩබ්.ජී. වතුර ටැංකි | | 1යි | |
| (ක) | සෝදන බේසන් 22'' × 16'' ක්‍රෝමියම් ප්ලේටඩ් ටැප් වේස්ට් ප්ලග්, බ්‍රැකට් ආදිය සමඟ අංග සම්පූර්ණ (සැපයිය හැකි ප්‍රමාණය සඳහන් කරන්න) | | 2යි | |
| (ග) | මැටියෙන් නිමවූ සින්ක් 30'' × 18'' × 8'' බ්‍රැකට් වේස්ට් ප්ලග් ආදිය සමඟ (සැපයිය හැකි ප්‍රමාණයන් සඳහන් කරන්න) | | 1යි | |
| (ච) | සම්මත ප්‍රමාණයේ ඩයමන්ඩ් මොඩල් ලිප් තුනේ භූමිතෙල් උදුන් | | 2යි | |

2. මෙම සියළුම ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හා එහි සංශෝධන අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරණ ලද නියම තත්වයන් අනුව තිබිය යුතුය. මෙම ද්‍රව්‍යයන් 1973 ජූලි මස 18 වැනි දින හෝ ඊට පෙර ලැබෙන්ට සැලැස්විය යුතුය.

3. ටෙන්ඩර් කරුවන්ට මින් කොටසකට හෝ සම්පූර්ණයෙන් හෝ මිල ගණන් සැපයිය හැක.

4. 1973 ජූලි මස 12 වැනි දින ප.ව. 2.30 ට පෙර ලැබෙන සේ දෙපිට පතකින් සකස් කරණ ලද ටෙන්ඩර් පත් හොඳින් මුද්‍රා තබන ලද කවරයක බහා, '' ගොනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා මිල ගණන් කැඳවීම '' යන්න කවරයෙහි සඳහන්කර, සභාපති ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉංජිනේරු අංශය, ගන්නොරුව, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

5. සියළුම ටෙන්ඩර් අවසාන කරණ ලද දිනයේ සිට දින 40 ක කාලයක් භාරගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ ඉන් කොටසක් හෝ භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ සම්පූර්ණ අයිතිය රජ සතුය.

7. මේ පිළිබඳ වැඩි විස්තර පේරාදෙණියේ, ගන්නෝරුවේ, කෘෂිකර්ම ඉංජිනේරු (මූලස්ථාන) ගෙන් ලබාගත හැක.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු).

ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
ගන්නොරුව, පේරාදෙණිය.
1973 මැයි මස 30 දින.

6–767—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### සත්ත්ව පාලන ගොවිපල්වල හිස් ගෝනි විකිණීම

මෙහි පහත උප ලේඛනයේ සඳහන් සත්ත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ගොවිපල්වල 1973 වර්ෂය තුළ එකතු වන හිස් ගෝනි විකිණීම සඳහා ලාංකිකයන්ගෙන්, සීල් තබා එවන ටෙන්ඩර්, පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.07.12 දින පෙ.ව. 10.00 දක්වා භාරගනු ලැබේ.

2. තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරුවන්ට ඒ බව දන්වූ ද සිට දින 30 ක් ඇතුළත එතෙක් ගොවිපල්වල එකතු වී ඇති සියළුම ගෝනි මිළදී ගෙන ඉවත් කර ගත යුතුය. අනතුරුව එක් එක් මාසයේ එකතු වන ගෝනි ඊළඟ මාසයේ 15 වැනිදට පෙර මිළදී ගෙන ගොවිපල්වලින් ඉවත් කර ගත යුතුය. වෙනත් අන්දමකින් බලය පවරා නැතහොත් මෙම කොන්දේසිය තරයේ ම පිළිපැදිය යුතුය.

3. ගෝනි මිළදී ගැනීමේදී තෝරා වෙන් කිරීමට හෝ වර්ග කිරීමට ඉඩ දෙනු නොලැබේ. ගොවිපලේ එකතුවී ඇති සියළුම ගෝනි ටෙන්ඩර් කරු-විසින් මිළදී ගත යුතුය.

4. එකී ගොවිපලවල් කොටස් 4 කට වෙන් කර ඇත. එක ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ එක් කොටසක් සඳහා පමණි. රු. 100/-ක් තැන්පත් කර එම මුදල් කුවිතාන්සිය පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය. 1973.07.10 දින දහවල් 12.00 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පෝර්ම සඳහා මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නැතහොත් කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට තැන්පත් කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන්නේ නම් බැංකුව විසින් සපයන අංක 118 දරණ පොදු ආකෘති පත්‍රය සම්පූර්ණ කර බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

6. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම නිසිලෙස පැහැදිලිව සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුතුව කවරයක බහා සීල් තබා '' සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය,'' යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් බහාලන කවරයේ උඩ වම් කෙළවරේ '' හිස් ගෝනි මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් '' යන්න පැහැදිලිව ලිවිය යුතුය.

7. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කර එවිය යුතුය. අතින් ම ගෙනවිත් භාර දිය හැකි ටෙන්ඩර් පත්‍ර ද මෙහි 4 වැනි ඡෙදයේ සඳහන් පරිදි සකස් කර, පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අධ්‍යක්ෂගේ කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

8. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසන් දින නියමිත වේලාවට පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම අධ්‍යක්ෂගේ කාර්‍යාලයේ දී සිදු කරනු ලැබේ.

7. ටෙන්ඩර් කරුවන් විසින් තම ලිපිනය නිවැරදිව පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූ ද, පිළිගනු ලැබුවා වූ ද, දේවල මුළු වියදමෙන් සියයට 5 ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ගේ නමින් තැන්පත් කිරීමට හා පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීම වත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මෙම මුදල ආපසු දෙනු ලබන්නේ යථෝක්ත කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණි. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු නොකලහොත්, ඔහුගේ ඇප මුදල රාජ සන්තක වනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ, වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක වියහැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත් කරු මෙයින් එකඟ වෙයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂාකිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

10. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්ම ගෙවිය යුතුයි.

11. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

12 යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය මාතර, ගොවිපල පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම් සඳහන් වන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධත්වය පළ කරන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. වැඩි විස්තර මාතර ගොවිපල පාලනය හා නිෂ්පාදන කාර්යාල යෙන් හා ලබුදූව රජයේ ගොවිපල කළමණාකරුගෙන් ද දැනගත හැකිය.

එච්. ඊ. නානායක්කාර,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි. ගොවිපල්).

1973 ජූනි මස 7 දින,
පේරාදෙණියේ දී ය.

6–791—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1973/74 ගබඩා බඩු ඇදීම

1. **සේවය සහ ටැන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**— මෙ කාර්යාලයෙන් හෝ මෙහි මතු 2 වන ඡෙදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි, 73.8.1 වනදා සිට 74.12.31 වනදා දක්වා වකවානුව තුල දුම්රිය පොළෙන්/පොළවලින්/පොළවලට/පොළට/ආයතනවලින් / ආයතනවලට/කාර්යාලයට/කාර්යාල යෙන් ගබඩා බඩු ඇදීම සඳහා ලාංකිකවූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතන වලිනුත්, සමූපකාර සමිතිවලිනුත් කොළඹ සෞ. සේ. අධිකාරි තැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් විය යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියම වූ ආකෘති පත්‍රය මතය. රු. 100 ක මුදලක් ළඟම ඇති කච්චේරියේ කොළඹ සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොට එහි ලදුපත ලබාගෙන ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර් කරු නිසි පරිදි අත්සන් කළ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1973.7.12 වනදා දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකිය :—

| | | | |
|---|---|---|---|
| අනුරාධපුර | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| මඩකලපුව | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| බදුල්ල | කලුතර | මාතලේ | වවුනියා |
| කොළඹ | මහනුවර | මාතර | |

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියළු ටැන්ඩර් කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මෙ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡෙදයෙන් කියැවුනු කවර හෝ සෞ. සේ. අධිකාරි කාර්යාලයකින් ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර් පත්‍ර "බඩු ඇදීම සඳහා ටැන්ඩරය" යනුවෙන් වම්පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා කොළඹ සෞ. සේ. අධිකාරි වෙත පිට නම ලියූ කවරයක බහා අස් ඔබා (සිල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1973.7.13 වනදා පෙරවරු 10 ට පෙර කොළඹ සෞ. සේ. අධිකාරි වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය ; නැතහොත් සෞ. සේ. අධිකාරි කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටැන්ඩර්කරුවන් කැමැති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරි කාර්යාලවල, ලේකම්/ගණකාධිකාරි වෙත බාරදී ඊට ලදු පතක් ලබාගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරිම සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර් කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර් කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොදා ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විට දැක්විය යුතුයි.

8. ටැන්ඩර් පත්‍ර 1973.7.13 වනදා පෙරවරු 10 ට කොළඹ සෞ. සේ අධිකාරි කාර්යාලයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම්ලත් නියෝජිතයින්ට හෝ, තමන් කැමති නම්, කොළඹ සෞ. සේ. අධිකාරි සමග විධිවිධාන සලසා ගෙන ඔහුගේ අවසරය පිටැ, ටැන්ඩර් විවෘත කරන විටැ පෙනී සිටිමින් තමන් ඉදිරිපත් කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළගණන්, ටැන්ඩර් බාරගැනීම අවසන් වන දවසේ සිටැ හය මාසයක් දක්වා පිළිගත හැකිසේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර් පත්‍ර පසුවැ අස්කළ හැකි නොවේ.

10. කොළඹ සෞ. සේ. අධිකාරි ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදනමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේදී ටැන්ඩර්කරු සේවයට ගතයුත්තේ ලාංකිකයන් පමණකි. මෙහිදී "ලාංකිකයා" යනු වෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. කොළඹ සෞ. සේ. අධිකාරිගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළාක් සේ සළකා, කොන්ත්‍රාත්තුව අවලංගු කොටැ එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥපනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම්, එකතු කිරීම්, යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම යෙකින්මැ ආණ්ඩුව මුදගත යුතුයි.

13. කොළඹ සෞ. සේ. අධිකාරි තැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 400 කට නො වැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදයක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව කොළඹ සෞ. සේ. අධිකාරි විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර් කරුට දන්වා දස දිනක් ඇතුළත දී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලිවුවොත් හෝ අපොහො සත් වුවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවී, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමටද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර් කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපෑලෙන් යවා තිබේ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර්කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. කොළඹ සෞ. සේ. අධිකාරිගේ අවසරය කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීම හෝ බෙදදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිස අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. කොළඹ සෞ. සේ. අධිකාරි තැන, සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැනැ සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කලැ ඒ කියන තැනැත්තා/ තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටෙන්ඩර් සියල්ලමැ හෝ ඉන් කිසිවක් හෝ පිටු දැකීමත්, යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂ තැන සමග කොන්ත්‍රාත්තුකරු බැඳුණු ගිවිසුම කවරක් වුවද, තමන් කැමති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස කොළඹ සෞ. සේ. අධිකාරි වෙත තිබේ. එබඳු විටෙකැදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකර වෙක්ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙනගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වූවොත් නැත්නම් අපොහොසත් වූවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වූවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ, ඔහු කොන්ත්‍රාත් තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුව ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නම ද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරට මැ සපුරා නැතොත්, කිසිදු ටැන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡේදයේ දක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිවටුවෙන්.**—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේද යන වග මේ සමඟ ඇති උපලේඛනයේ දක්වේ. මෙහි දක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**— කොන්ත්‍රාත් කරු විසින් ගෙනගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවුවොත්, හෝ සොරකම් කරනු ලැබුවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක්—හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දැරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද ඇතුළත් කොටැ, අලාභහානි සිදුවූ හෝ හොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දක්වියයුතු මිළ ගණන්.** —(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී—I උප ලේඛනයෙහි දක්විය යුතු :—

පළමුවැ රාත්තල් 28 දක්වා ද,

දෙවනුවැ රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,

තුන්වනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,

සිව්වනුවැ රාත්තල් 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වා ද,

පස්වනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වා ද,

හයවනුවැ හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,

හත්වනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වා ද,

අටවනුවැ හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද,

නවවනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද,

දසවනුවැ හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරමැ ගෙනැ යාම සඳහා එක් එක් බර ගොල්ල උදෙසා මිල ගණන් දක්විය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දක්වෙන බර කුමක් වුව ද මුළු දුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩුනම්, ඒවායේ ගෙවීම් බී—I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිවේ නම් ඒවායේ ගෙවීම් තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී—II උපලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යැම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී—II උප ලේඛනයෙහි මිළ ගණන් දක්විය යුතුයි :—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා,
(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා,
(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා,
(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිල ගණන් වෙන වෙනමැ දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

**(ඇ) සඳහන්කර ඇති මිළ ගණන් සාධාරණ විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.**

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

වෛද්‍ය එස්. පී. කුලතිලක,
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

1973.6.11.

————,
නිකුත් කරන නිලධාරියාගේ
අත්සන.

1973

————,
ටැන්ඩර්කරුගේ අත්සන.

1973

## 1973–74 ට ගබඩා බඩු ඇදීම සඳහා ටැන්ඩර් කොන්දේසිවල 24 වන ඡෙදයේ කියවෙන උපලේඛනය

### කොළඹ කොට්ඨාශය

#### 1 වෙනි කොටස—දෙහිවල සිට රත්මලාන දක්වා

| දුම්රියපොලෙන් /පොලට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන් /ස්ථානයට | ආයතනවලින් /ආයතනවලට, කාර්යාලවලින් /කාර්යාලවලට | කිට්ටුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| දෙහිවල ... | දෙහිවල සෞ. වෛ. නි. ... | 1 |
| | දෙහිවල දන්ත චිකිත්සාගාරය ... | $\frac{1}{4}$ |
| | කළුබෝවිල රෝහල ... | 2 |
| රත්මලාන ... | රත්මලාන බෙහෙත් හල ... | 1 |
| | කැස්බෑව බෙහෙත් හල ... | 7 |
| | කොතලාවල පුර ද. චිකිත්සාගාරය | 2 |
| මොරටුව ... | මොරටුව සෞ. වෛ. නි. ... | $\frac{1}{2}$ |
| | මොරටුව රෝහල ... | 1 |
| | මොරටුව දන්ත චිකිත්සාගාරය ... | $\frac{1}{2}$ |
| | වෑතර මාතෘ නිවාසය ... | 9 |
| | කොරළවැල්ල බෙ. හ. ... | 2 |
| | පිළියන්දල මාතෘ නිවාසය ... | 6 |

#### 2 වෙනි කොටස—වේයන්ගොඩ සිට අඹේපුස්ස දක්වා

| | | |
|---|---|---|
| වේයන්ගොඩ ... | අලවල බෙ. හල ... | 11 |
| | නිහාරිය බෙ. හල ... | 4 |
| | වතුපිටිවල රෝහල ... | 5 |
| | දේවාලපොල බෙ. හල ... | 4 |
| | කලගෙඩිහේන මා. නි. ... | $3\frac{1}{2}$ |
| | වේයන්ගොඩ මා. නි. ... | $\frac{1}{4}$ |
| | ඌරාපොල බෙ. හල ... | 9 |
| | පස්යාල බෙ. හල ... | 6 |
| | නාඹුළුව මා. නි. ... | 8 |
| | කුරුවාමුල්ල ද. වි. ... | 10 |
| | ශාන්ත මරියා විදුහල ... | $\frac{3}{4}$ |
| | මහ විද්‍යාලය පස්යාල ... | 5 |
| පල්ලෙවෙල ... | පල්ලේවෙල බෙ. හල ... | $\frac{1}{4}$ |
| | බෝකලගම මා. නි. ... | 5 |
| | මුද්දරගම බෙ. හල ... | $3\frac{1}{2}$ |
| මීරිගම ... | දිවුලාපිටිය රෝහල ... | 9 |
| | කොටදෙනියාව බෙ. හල ... | $6\frac{1}{6}$ |
| | මීරිගම රෝහල ... | $1\frac{1}{2}$ |
| | මීරිගම සෞ. වෛ. නි. ... | $2\frac{1}{2}$ |
| | වේවැල්දෙනිය බෙ. හල ... | $4\frac{1}{2}$ |
| | හල්පේ බෙ. හල ... | 3 |
| | මාලදෙනිය බෙ. හල ... | 4 |
| අඹේපුස්ස ... | අඹේපුස්ස ... | 1 |

#### 4 වෙනි කොටස—කඳාන සිට කොච්චිකඩේ දක්වා

| | | |
|---|---|---|
| කඳාන ... | කඳාන ලය රෝහල ... | $1\frac{1}{2}$ |
| ජාඇල ... | ජාඇල රෝහල ... | $\frac{1}{2}$ |
| | ජාඇල සෞ. වෛ. නි. ... | $\frac{1}{2}$ |
| | බෝපිටිය කුමාර විද්‍යාලය ... | 4 |
| | පමුණුගම බෙ. හල ... | 5 |
| සීදූව ... | සීදූව බෙ. හල ... | $\frac{3}{4}$ |
| මීගමුව ... | මීගමුව සෞ. වෛ. නි. ... | 1 |
| | මීගමුව රෝහල ... | 1 |
| | හල්පේ බෙ. හල ... | 7 |
| | බඩල්ගම බෙ. හල ... | $13\frac{1}{2}$ |
| | පිටිපන බෙ. හල ... | 3 |
| | තලාහේන මා. නි. ... | 7 |
| | ආඩිඅම්බලම බෙ. හල ... | 7 |
| | හරිස්චන්ද්‍ර විද්‍යාලය ... | 1 |
| | දූනගහ මා. නි. ... | 10 |
| | පිටිපන ද. වි. ... | $3\frac{1}{2}$ |
| | අවේමරියා ද. වි. ... | $\frac{1}{4}$ |
| | ටී. ඇස්. වයි. ඕ. මීගමුව ... | 2 |
| | නිව්ස්ටඩ් විදුහල ... | 2 |
| | තිඹිරිගස්කඩුව ද. වි. ... | — |

| දුම්රියපොලෙන් /පොලට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන් /ස්ථානයට | ආයතනවලින් /ආයතනවලට කාර්යාලවලින් /කාර්යාලවලට | කිට්ටුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| කොච්චිකඩේ ... | ගොඩිගමුව රෝහල ... | 8 |
| | කොච්චිකඩේ සෞ. වෛ. නි. ... | $\frac{1}{4}$ |
| | කොච්චිකඩේ බෙ. හල ... | $\frac{1}{2}$ |
| | කඳවල බෙ. හල ... | 3 |

#### 5 වැනි කොටස—බේස්ලයින් පාර සිට අවිස්සාවේල්ල දුම්රිය ස්ථානය දක්වා

| | | |
|---|---|---|
| බේස්ලයින් පාර ... | කොළොන්නාව සෞ. වෛ. නි. ... | 3 |
| | වැල්ලම්පිටිය බෙ. හල ... | 2 |
| කොටාරෝඩ් ... | තලංගම බෙ. හල ... | 6 |
| නුගේගොඩ ... | නුගේගොඩ සෞ. වෛ. නි. ... | $\frac{1}{4}$ |
| | නුගේගොඩ බෙ. හල ... | $1\frac{1}{4}$ |
| | ආනන්ද ශාස්ත්‍රාලය ද. වි. ... | 1 |
| | අනුලා විද්‍යාලය ... | $\frac{1}{2}$ |
| | ශා. ජෝන් පාසැල ... | $\frac{1}{4}$ |
| | වි. ජයවර්ධන පුර ද. වි. ... | — |
| නාවින්න ... | මහරගම පිළිකා රෝහල ... | 2 |
| | මහරගම ද. විදුහල ... | 1 |
| | බොරලැස්ගමුව බෙ. හල ... | $3\frac{1}{2}$ |
| පන්නිපිටිය ... | පන්නිපිටිය බෙ. හල ... | $\frac{1}{4}$ |
| හෝමාගම ... | හෝමාගම රෝහල ... | $\frac{3}{4}$ |
| | පනාගොඩ ද. වි. ... | 5 |
| | හෝමාගම සෞ. වෛ. නි. ... | $\frac{1}{2}$ |
| | කඩුවෙල බෙ. හල ... | 8 |
| | මාලබේ ද. වි. ... | — |
| | නවගමුව රෝහල ... | — |
| | අතුරුගිරිය රෝහල ... | — |
| | කොට්ටාව ආනන්ද විද්‍යාලය ... | — |
| | දැදිගමුව බෙ. හල ... | — |
| | කොට්ටාව ආනන්ද විද්‍යාලය ... | — |
| | බ්‍රාහ්මණගම බෙ. හල ... | — |
| මීගොඩ ... | මීගොඩ බෙ. හල ... | $1\frac{1}{2}$ |
| පාදුක්ක ... | පාදුක්ක බෙ. හල ... | 1 |
| | පාදුක්ක මා. නි. ... | 1 |
| | පාදුක්ක සෞ. වෛ. නි. ... | 1 |
| | හංවැල්ල ප්‍රාථමික විද්‍යාලය ... | 5 |
| | හංවැල්ල බෙ. හල ... | 5 |
| | වේරගල රෝහල ... | 4 |
| | ශා. ජෝන් බොස්කෝ ... | 5 |
| | පින්නවල බෙ. හල ... | 5 |
| වග ... | වග බෙ. හල ... | $1\frac{1}{2}$ |
| | සාලාව මා. නි. ... | 4 |
| කොස්ගම ... | කොස්ගම රෝහල ... | $3\frac{1}{2}$ |
| | පූගොඩ මා. නි. ... | $3\frac{1}{2}$ |
| | මීතිරිගල මා. නි. ... | 8 |
| | කොස්ගම මහා විද්‍යාලය ... | 1 |
| අවිස්සාවේල්ල ... | අවිස්සාවේල්ල රෝහල ... | $\frac{1}{8}$ |

#### 6 වැනි කොටස

රජයේ බෙහෙත් ගබඩාවේ සිට පහත සඳහන් දන්ත චිකිත්සාගාර ආනන්ද විද්‍යාලය, මරදාන ; ජින්තුපිටිය, රජයේ බෙහෙත් හල ; නීල් වීදිය විද්‍යාලය, කොටහේන ; රජයේ පාසල, හැව්ලොක් ටවුම ; කුමාර විද්‍යාලය, කොටහේන ; ඉසිපතන මහා විද්‍යාලය, හැව්ලොක් ටවුම ; සාන්ත බෙනඩික් විද්‍යාලය, කොටහේන ; බාලිකා විද්‍යාලය, කොළඹ 7 ; රජයේ ජ්‍යෙෂ්ඨ මිශ්‍ර පාසැල, මාලිගාවත්ත ; සඝිරා විද්‍යාලය, මරදාන ; මෝදර නගර සභා බෙහෙත් හල, නාලන්ද විද්‍යාලය, රාජකීය විද්‍යාලය, ශාන්ත පීටර් විද්‍යාලය, විශාකා විද්‍යාලය, සහ මහානාම විද්‍යාලය, කොළඹ 3.

6–756—73.06.22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

### ලංකා ධීවර සංස්ථාව

**කොරිගේටඩ් කාඩ්බෝඩ් පෙට්ටි 7,000 ක් සාදා සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

ඉහත සඳහන් සේවය සඳහා ලංකා ධීවර සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.06.27 දින පස්වරු 2.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ආපසු ගෙවනු ලබන රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් පසු පහත අත්සන් කරන අයගෙන් 1973.06.26 දින පෙරවරු 12 තෙක් ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

කළමනාකාර සැපයීම් සහ ගබඩා.

රොක්හවුස් පටුමඟ,
කොළඹ 15,
1973 ජූනි මස 11 වැනි දින.

6–853—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවේ ඇති තඹ සුන්බුන් මිලයට ගෙන ඉවත් කර ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් (ලිපිනය—දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, තැ. පෙ. 355, කොළඹ—10) 1973 ජූලි මස 25 වෙනි දින පෙ. ව. 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කිරීමට පෙර අවශ්‍ය වුවහොත්, ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සේවා භාර ගැනීමට හා සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට අදාලවන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. කොළඹ 10 යේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 250 ක් කොළඹ 10 යේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාර්යාලයෙහි හෝ කොළඹින් පිට නම්, ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1973 ජූලි මස 21 වෙනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 ජූලි මස 25 වෙනි දින (බදාදා) පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩිමනත් විස්තර අවශ්‍ය නම් දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැක.

එම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

කොළඹ 10,
1973. 05. 31 වෙනි දින.

6–715—73.06 22 දින අංක 65 දරන ගැසට් පත්‍රය

---

### අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත්, කොළඹ 8, මැගසින් පාරේ පිහිටි බේකරියට ගිනිසපු ලීයෙන් පාන් පෙට්ටි 50 ක් සාදා සැපයීම සඳහා මිල ගණන් පත් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූලි මස 09 දින අ.භා. 2 දක්වා භාරගනු ලැබේ.

මිල ගණන් පෝර්ම සහ වැඩි විස්තර කොළඹ 1, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් 1973. 07. 09 දින දහවල් 12 දක්වා ලබාගත හැක.

සී. ඩී. ප්‍රනාන්දු,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973. 06. 07 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

6–727—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාතර්මේන්තුව

කළුතර බලවේග පෝෂකර්ම ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 07. 12 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 50,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචිව ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිසි.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 07. 11 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/52)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 06. 11

6–792—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාතර්මේන්තුව

රුවන්වල බලවේග පෝෂකර්ම ආයතනයට ජලය සැපයීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 07. 12 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම් කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 5,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකි ය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 25 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 07. 11 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සිය හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1 (1/53)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 06. 11

6–793—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

ලග්ගල බලවේග පේෂකර්ම ආයතනයේ ලිඳ සහ පොම්ප කාමරය වටා කටුකම්බි ගැසීම සඳහා කොළඹ 1, හෝමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1973.07.13 දින පෙ.ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 2,500 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මේ දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 07. 12 දින පෙ. ව. 12 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/54).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හෝමාස් ගොඩනැගිල්ල,
කොළඹ, 1.
1973. 06. 13

6–876—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## මන්නාරම කච්චේරිය

මන්නාරම දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973.06.29 වැනි දින දහවල් 12 දක්වා මන්නාරම දිසාපති විසින් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(1) මඩුවෙහි කජු වගා ව්‍යාපාර ස්ථානයට ප්‍රවේශ මාර්ගය, 'සී. ඩී' II කොටස.

(2) මඩුවෙහි කජු වගා ව්‍යාපාර ස්ථානයට ප්‍රවේශ මාර්ගය 'ඊ.එෆ්' II කොටස.

2. මෙම වැඩ සඳහා 1973.06.28 වැනි දින දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ දිසාපති විසින් මන්නාරම කච්චේරියේ දී නිකුත් කරනු ලබන ටෙන්ඩර් පෝරම, ටෙන්ඩර් කරුවන් විසින් සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව මන්නාරම දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරන ලද ටෙන්ඩර් කරුවන් සහ ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිද මේ සඳහා සුදුස්සෝ වෙති. එම සමිති වලින් මෙම ටෙන්ඩර් පෝරම ඉදිරිපත් කිරීමේදී, ඔවුනට මේ වැඩය කිරීමට අවශ්‍ය මුදල් ඇති බවට ඔවුන්ගේ ප්‍රාදේශීය ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. බාහිර ටෙන්ඩර්කරුවන් විසින් ඉල්ලුම් කරන විට දී ඉල්ලුම් කරනු ලබන එක් එක් වැඩය වෙනුවෙන් රු. 25 බැගින් මන්නාරම කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිතිවලටද මෙසේ තැන්පත් මුදල් තැබීම අනවශ්‍යය.

3. 1973. 06. 29 දින අ. භා. 12 ට පෙර මන්නාරම දිසාපති වෙත ලිපි කවරයේ "මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රවේශ මාර්ගය කජු වගා ව්‍යාපාරය සෑදීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ මන්නාරම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් දැමීමට ද පුළුවන. නියමිත දිනයෙහි නියමිත වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් ගැන සලකා බලනු නොලැබේ.

4. 1973. 06. 29 දින අ. භා. 12.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන වේලාවේදී සියළුම ටෙන්ඩර් කරුවන්ට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. සතුටුදායක ටෙන්ඩර්කරුවන් හට ගිවිසුමකට බැඳෙන ලෙස ලියවිල්ලකින් දන්වනු ලැබේ. කොන්ත්‍රාත්තු කරනු ලබන මුදලින් සියයට 2 (2%) සතුටුදායක ලෙස නිම කිරීමට ඇප ශයෙන් ඔහු විසින් තැන්පත් කළ යුතුය. මෙසේ තබන ලද මුදල් සතුටුදායක ලෙස වැඩ නිම කරන තෙක් ආපසු ගෙවනු නොලැබේ. සතුටුදායක ටෙන්ඩර් කරුවන් හට මෙසේ දැනුම් දී දින 10ක් ගෙවීමට පෙර ඔහු ගිවිසුමකට බැඳීමට අපොහොසත් වුවහොත් ඔහුගේ තැන්පත් මුදල වන රු. 25 රාජසන්තක කරනු ලැබේ.

6. නියම කරන ලද වැඩ ප්‍රමාණයෙන් සියයට අනූවක් (90%) වෙනුවෙන් මුදල් ගෙවනු ලැබේ. ඉතිරි සියයට 10 (10%) ඉහත 5 වැනි ඡේදයෙහි දක්වා ඇති පරිදි තැන්පත් මුදලත් සමග සතුටුදායක අන්දමින් වැඩය නිම කර මාස තුනක් ගතවූ පසු ගෙවනු ලැබේ.

එන්. වේදරණ්ය සෙයොන්,
උප දිසාපති.

1973.05.28 වැනි දින,
මන්නාරම දිසාපති කාර්යාලයේ දීය.

6–860—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## ලිහිසි තෙල් ඇසිරිම පිණිස ඉම්පීරියල් ගැළුම් එකේ දිගපි සතරැස් ටින් සකස් කිරීම සඳහා පැතලි ටින් තහඩු 4,50,000 සහ ඊට සම්බන්ධ අමතර කොටස් කට්ටල සැපයීම සඳහා ටෙන්ඩර්

ඉහත සඳහන් දේ ආනයනය කොට සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ආපසු ලබා ගත හැකි රු. 100 තැන්පත් මුදලක් ගෙවාලීමෙන් ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි සහ නියමිතයන් ගබඩා හා සැපයීම් කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

1973 ජූලි 6 දින පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් කෙරේ.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3,
1973. 06. 11 වන දින.

6–857—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

### වාහන විකිණීම

1 ශ්‍රී 245 (ඕපල් කපිතාන්) හා 4 ශ්‍රී 5972 (ටොයිපෙට්) යන වාහන විකිණීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

මෙම වාහන වැඩ කරන වේලාවන්හිදී කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 288 දරණ ස්ථානයෙහිදී පරීක්ෂා කළ හැකිය.

කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 288 දරණ ස්ථානයෙහි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන ඉංජිනේරුතැනගෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝරම ලබාගත හැකි අතර, එක් එක් වාහනය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

මුදලින් හෝ මුදල් ඇනවුමක මගින් ටෙන්ඩර් පෝරම ලබාගත හැකිය. තැපැල් මගින් ටෙන්ඩර් පත් සඳහා කරන අයදුම් ටෙන්ඩර් භාර ගනු ලබන අවසාන දිනට සතියකට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

නිදහස් ණය පහසුකම් භුක්ති විඳින රජයේ දෙපාර්තමේන්තුවලට, රාජ්‍ය සංස්ථාවලට සහ වෙනත් අනුමත කරන ලද සංවිධාන සහ ආයතනවලට ටෙන්ඩර් තැන්පත් මුදල් නොගෙවා ටෙන්ඩර් පෝරම ඉල්ලීම් කළ හැකිය. එවැනි ආයතන ටෙන්ඩර් පෝරම සඳහා අයදුම්පත් එවන විට අංකය/ඔප්පු කිරීමේ සහතික ආදිය සැපයිය යුතුය.

ටෙන්ඩර් පෝරම සඳහා අයදුම් කරන විට වාහනයේ ලියාපදිංචි කිරීමේ අංකයද සඳහන් කළ යුතුය. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමයට අනුරූප ටෙන්ඩර් තැන්පත් මුදල් ලදුපත අමුණාලිය යුතු අතර, මේ දේ බහා එවන ලිපි කවරයේ වම් පස උඩ කෙළවරෙහි "අංක..............දරණ වාහනය වෙනුවෙන් ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය මෙකී ලියුම් කවරයේ වම් පස පහතින් සඳහන් කළ යුතුය. කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 267 හි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන අධිකාරි (පරිපාලන) වෙත ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පෙර ලියාපදිංචි තැපැලෙන් ටෙන්ඩර් එවිය යුතුය.

ටෙන්ඩර් පිරිනැම්ම්වලට අදාල මිළ ගණන් පළමුව පැහැදිලි ඉලක්කම්වලින් ද, අනතුරුව වචනයෙන් ද සඳහන් කළ යුතුය. මැකීම් හා වෙනස් කිරීම් සියල්ලම ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන තැබිය යුතුය.

ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එහි ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ බලය ලත් පුද්ගලයනට සිටිය හැකිය. ටෙන්ඩර්කරුගේ නම මෙන්ම ඔවුන් විසින් දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් ද ටෙන්ඩර් විවෘත කළ වහාම කියවනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාරගනු ලබන අවසාන දිනයේ සිට සතියක කාලපරිච්ඡේදයක් යනතුරු ඔවුන්ගේ පිරිනැමීම් පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුය. ටෙන්ඩර් පෝරම යෙහි දක්වා ඇති ලිපිනයට විදුලි පුවතක් මගින් හෝ ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිපියක් මගින් හෝ දන්වූ විට හෝ එහි දන්වීම ඉහත කී ලිපිනයෙහි සඳහන්ව ඇති ස්ථානයෙහි තැබූ විට එම ටෙන්ඩර් පිළිගත් බව සාර්ථක ටෙන්ඩර්කරුට දන්වූවා සේ සලකනු ලැබේ.

ස්වකීය ටෙන්ඩරය පිළිගත් බව දන්වා සතියක් ගෙවී යෑමට පෙර ටෙන්ඩර්කරු විසින් ඉතිරි මුදල ගෙවිය යුතුය. ඉතිරි මුදල ගෙවූවිට වාහනය භාර ගැනීම සඳහා බලය දෙන ලිපියක් නිකුත් කරනු ඇත.

ඕනෑම ටෙන්ඩරයක් කිසිම හේතුවක් නොදන්වා පිළිගැනීම් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රක්ෂණ සංස්ථාව සතුය.

වෙනත් විස්තර ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රධාන ඉංජිනේරු අමතා ලබාගත හැක.

1973 ජූනි මස 29 වැනි දින පස්වරු 3.30ට ටෙන්ඩර් භාරගැනීම අවසාන වන අතර, ඉන් අනතුරුව කොළඹ 2, යුනියන් පෙදෙසේ අංක 267 ප්‍රධාන අධිකාරී (පරිපාලන) ගේ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

ප්‍රධාන අධිකාරී (පරිපාලන).

1973 ජූනි 6 දින.

6–852—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දූන්වීම්

**(1) 1973 වර්ෂය තුළ රත්නපුර ආයුර්වේද රෝහලේ කිලිටි රෙදි ඇපිල්ලීම**

| ලැබුණු ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් ගාස්තු ප්‍රමාණය කැබැල්ලකට රු. ශ. |
|---|---|---|
| 1 ... | යූ. ආර්. සාමෙල් මහතා, නො. 61, ගොඩිගමුව, රත්නපුරය | 0 23 |

**(2) 1973 වර්ෂය තුළ රත්නපුර ආයුර්වේද රෝහලේ කිලිටි රෙදි ඇපිල්ලීම**

| | | |
|---|---|---|
| 1 ... | ටී. එච්. සෙනෝරිස් මහතා, ඩී. එල්. ආර්. දයා රත්න මහතා බාරේ, මල්පිටිය, බෝයගනේ | 0 28 |

**(3) 1973 වර්ෂය තුළ කොළඹ ආයුර්වේද මහ රෝහලේ කිලිටි රෙදි ඇපිල්ලීම**

| | | |
|---|---|---|
| 6 ... | පී. පී. සැමී මහතා, 233, කෝට්ටේ පාර, කොළඹ 8 | 0 14 |

**(4) 1973 වර්ෂය තුළ නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයේ කිලිටි රෙදි ඇපිල්ලීම**

| ලැබුණු ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | ප්‍රමාණය කැබැල්ලකට රු. ශ. |
|---|---|---|
| 3 ... | ඒ. සී. ප්‍රනාන්දු මහතා, අංක 699, ගංගොඩවිල, නුගේගොඩ | 0 25 |

**(5) 1973 වර්ෂය තුළ අනුරාධපුර ආයුර්වේද රෝහලේ කිලිටි රෙදි ඇපිල්ලීම**

| | | |
|---|---|---|
| 3 ... | ඇම්. ජෝෂප් මහතා, අනුරාධපුර පාර, මිහින්තලේ | 0 24 |

වී. බ. වැවේගම,
ආයුර්වේද කොමසාරිස්.

1973 ජූනි මස 07 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දීය.

6–771—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**දැව වෙන්දේසිය—බස්නාහිර දිසාව**

තොග 14 කින් යුත් කැති 1 ක්ද, පොරෝ 11 ක් ද, හරස් කියත් 1 ක් ද, පිහියා 8 ක් ද, දලිනුල් 1 ක් ද, කෝදු 1 ක් ද, ඉරුම් කියත් 1 ක් ද රත්නපුර බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1973 ජූලි මස 10 වැනි දින පෙරවරු 10 ට බලංගොඩ අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම භාණ්ඩ බලංගොඩ අඩවි වන කාර්යාලයේ ඇත.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන හවතුන් වෙන්දේසියට ප්‍රථම භාණ්ඩ බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ වැඩිපුර විස්තර රත්නපුර දිසා වන නිලධාරීගෙන් හෝ බලංගොඩ අඩවි වන නිලධාරීගෙන් ලබාගත හැක.

එච්. ආර්. පීරිස්,
දිසා වන නිලධාරී—බටහිර දිසාව.

දිසා වන කාර්යාලය,
[illegible]නපුර.

[illegible]5—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**දැව වෙන්දේසිය—බස්නාහිර දිසාව**

තොග 3 කින් යුත් බුරුත, මැන්ඩෝරා, ගොඩකිරිල්ල, කුඹුක්, හැළඹ, පලු සහ කොලොන්, කඳන් සහ ඉරු දැව ඝන අඩි 251.4ක් සහ අඩි 4 ක් දිග හරස් කියත් 1 ක් බස්නාහිර දිසා වන නිලධාරි විසින් 1973 ජූලි 9 දින පෙරවරු 10 ට ඇඹිලිපිටිය අඩවි වන කාර්යාල යේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට පෙර මෙම දැව සහ භාණ්ඩ බලා සෑහීමකට පත්වන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසා වන නිලධාරීගෙන් හෝ ඇඹිලිපිටිය අඩවි වන නිලධාරීගෙන් ලබාගත හැක.

එච්. ආර්. පීරිස්,
දිසා වන නිලධාරි—බටහිර දිසාව.

දිසා වන කාර්යාලය,
රත්නපුර.

6–847—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**දැව වෙන්දේසිය—බස්නාහිර දිසාව**

තොග 8 කින් යුත් මිල්ල, කරවි, කීන, හොර, නාඉඹුල්, පෙලෙන්, අඟුරු මීරිය, තිත්ත ඇට සහ කටබොඩ, කඳන් සහ ඉරු දැව ඝණ අඩි 381.7 ක් ද, හොර සහ දුන් සිල්පර 37 ක් ද, දිග කියත් 2 ක් ද, දලිනුල් 1 ක් ද, ඉල්ලන්කුරු 1 ක් ද, ගැල්වනයිස් කුඩා බාල්දි 1 සහ පොරෝ 4 ක් ද බස්නාහිර දිසා වන නිලධාරී විසින් 1973. 7. 2 වෙනි දින පෙ. ව. 10 ට දෙහිඕවිට අඩවි වන කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියට පෙර මෙම දැව සහ භාණ්ඩ බලා සෑහීමකට පත්වන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. වෙන්දේසිය පිළිබඳ වැඩිදුර විස්තර රත්නපුර දිසා වන නිලධාරීගෙන් හෝ දෙහිඕවිට අඩවි වන නිලධාරීගෙන් ලබා ගත හැක.

එච්. ආර්. පීරිස්,
දිසා වන නිලධාරී—බටහිර දිසාව.

දිසා වන කාර්යාලය,
රත්නපුර.

6–848—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් මෝටර් කාර් රථය 1973 ජූලි මස 04 වැනි බදාදා පෙ. ව. 10 ට කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ මගින්ගේ පර්යන්ත ගොඩනැගිල්ල අසලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජූලි මස 03 වැනි දින පෙ. ව. 9.30 සිට ප. ව. 3.30 දක්වා එය පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසිය අවසානයේ දී වැඩිම ඉල්ලුම්කරු විසින් එහි වටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

වෙන්දේසිය අනුමතකර දින හතක් ඇතුළත දී සම්පූර්ණ මුදල ගෙවා, එය ගෙන නොගිය හොත් එය නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වැනි දින ගැසට් පත්‍රය බලන්න.

300 ඇස් ඊ වර්ගයේ පාවිච්චි කළ මර්සිඩීස් බෙන්ස් රථයක්. 1965 දී ලියාපදිංචි කර ඇත. පසු පස වායු මුවාවට (වින්ඩ්ස්ක්‍රීනයට) හානි සිදුවී ඇත.

ජී. ඕ. ද සොයිසා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

පිඕ/විකිණීම්/39/73,
ශ්‍රී ලංකා රේගුව,
කොළඹ, 1973.06.11 වැනි දින.

6–772—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ බණ්ඩාරනායක තටාක අංක 2 හා 4 ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1973 ජූලි මස 05 වැනි දින පෙ. ව. 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජූලි මස 04 වැනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් සියයට 50 ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

ඩී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය. ඒ සී/විකිණීම්/100
1973 මැයි මස 25 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. යකඩ සහ වානේ මුරිච්චි මලු 1
2. කපුරු කුඩු මලු 1 යි
3. දේශීය බෙහෙත් (දේවදාර) මලු 1 යි
4. ෆ්ලොරසන් වියඹි කාටුන් 2 යි
5. ෆෝමිකා ෂීට් ක්‍රේට් 1 යි
6. අමු කපු මලු 20 යි
7. කපු නූල් මලු 8 යි
8. දුනු මිටි 5 යි
9. "සෝඩියම්" පීප්ප 2 යි
10. වානේ තහඩු තොග 1 යි
11. ටින් තහඩු තොග 1 යි
12. "ඉන්ජින්" අමතර කොටස් පෙට්ටි 9 යි
13. ඇණ සහ මුරිච්චි පෙට්ටි 1 යි
14. යන්ත්‍ර කොටස් පෙට්ටි 5 යි
15. මැටි පයිප්ප තොග 1 යි
16. රබර් මුඩි කාටුන් 1 යි
17. ගිස් ටින් පෙට්ටි 1 යි
18. හිස් පීප්ප (ප්ලාස්ටික් කෙග්) ලොට් 1 යි
19. පට්ටම් යකඩ රෝල් ගොඩවල් 1 යි
20. ගැල්වනයිස් කම්බි තොග 1 යි
21. පොත් කාටුන් 1 යි
22. මෝටර් බයිසිකල් අමතර කොටස් පෙට්ටි 2 යි
23. රථවාහන අමතර කොටස් මලු 6 යි
24. "විටරෝම්" කාටුන් 3 යි
25. මහන මැෂින් ප්‍රධාන කොටස් 2 යි
26. ඩයි මලු 1 යි
27. කපුනූල් කාටුන් 1 යි
28. රථවාහන අමතර කොටස් මලු 1 යි
29. ටර්පන්ටයින් පීප්ප 120 යි
30. ටයර් රෝල් 30 යි
31. නොබැඳි පීප්ප තොග 1 යි
32. කම්බි දැල් තොග 1 යි
33. අමු යකඩ තොග 1 යි
34. බෙහෙත් ද්‍රව්‍ය පෙට්ටි 1 යි
35. ප්ලාස්ටික් බඳුන් 2 යි
36. රසායන ද්‍රව්‍ය බෝතල් තොග 1 යි
37. හිස් පීප්ප තොග 1 යි
38. පැතලි යකඩ මිටි 4 යි
39. වානේ ෂීට් මිටි 1 යි
40. පෝරිනු ගඩොල් තොග 1 යි.

බණ්ඩාරනායක ගුදම නො. 2

1. හිස් පීප්ප 363 යි
3. ඔතන කඩදාසි පැලට් 1 යි
4. වානේ තහඩු මිටි 14 යි
7. පී. වී. සී. කොම්පවුන් මලු 15 යි
8. ප්ලාස්ටික් බඳුන් (සල්ෆියුරික් ඇසිඩ්) 2 යි
9. යකඩ පට්ටම් රෝල් 4 යි
10. රසායන ද්‍රව්‍ය පීප්ප 1 යි
11. මුද්‍රිත පොත් කාටන් 1 යි
12. ඇහිරීම් පැලට් 2 යි
13. රථවාහන අමතර කොටස් පෙට්ටි 1 යි.

6–717—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

## ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අල්මාරි කෑම සේප්පුවක්, මේස හතරැස් 16 ක්, රාක්ක 2 ක්, යතුරු ලියන මේස 10 ක්, ලී කැබිනෙට්ටු 5 ක්, පත්‍ර ස්ථම්භයක්, ඇඳි පුටු 17 ක්, අල්මාරි 2 ක්, හාන්සි පුටු 2 ක්, සාමාන්‍ය පුටු 51 ක්, ලී ලාච්චු 1823 ක්, බයිසිකල් ස්ථම්භයක්, ලාච්චු 30 රාක්ක 4 ක්, කබඩ් එකක්, ප්‍රදර්ශන මේස 4 ක්, සාමාන්‍ය මේස 6 ක්, දත් ලෑලි 2 ක්, කැරම් ලෑලි එකක්, කවකටු පෙට්ටි 17 ක්, දුනු තරාදි බර කිරන එකක්, අඩි 50 මනින පටි 9ක්, අඩි 100 මනින පටි 5 ක්, පඩි කට්ටල් සෙට් 4 ක්, මලු රෙදි 31 ක්, ෆිල්ටර් එකක් යනාදී ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ තොගයක් කොළඹ 7, 16/7, ඇල්බට් චන්ද්‍රවංකය, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු භූමියේ දී 1973.07.06 වැනි දින පෙ. ව. 10 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. ඉහත සඳහන් භාණ්ඩ 1973.07.04 වැනි දින සිට කාර්යාලයීය වේලාවන් තුළ පරීක්ෂා කර බැලිය හැකිය.

ජයග්‍රාහී ඉල්ලුම්කරුවන් මුදලින්ම ගෙවීම කළ යුතු අතර වෙන්දේසිය අවසන් වූ වහාම මිළදී ගත් භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

ඇල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව,
අංක 6, ඇල්බට් චන්ද්‍රවංකය,
කොළඹ 7.
1973 ජුනි මස 8 වැනි දින.

6–770—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

**නොතාරිස් අවසාන පරීක්ෂණය සඳහා ඉල්ලීමට පෙර කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නැගෙනහිර ගිරුවා පත්තුවේ හාතාගල "චන්දන" නිවසේ පදිංචි පියෝරිස් එදිරිසූරිය වන මම, අද සිට පුරා මසක් ගතවූ පසු හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් ආඥපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

පී. එදිරිසූරිය.

"චන්දන",
හාතාගල, හුංගම,
1973. 06. 05 දින.

6–833—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණය ඉල්ලීමට පෙර කරන නීත්‍යානුගත දැන්වීමයි**

මතුගම-බෝපිටියේ පදිංචි වැඩුම්පුරකෝරාළලාගේ සෝදිරිස් ධම්මවඩීන වන මම, කළුතර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් සුදුසුකම් ලබා ගැනීම සඳහා නියමිත ලියවිලි 1907 තේ අංක 1 දරණ නොතාරිස් පණතේ 7 වැනි වගන්තියේ සඳහන් පරිදි, මෙදින සිට පුරා මාසයක් ගතවූ පසු, රෙජිස්ට්‍රාර් ජනරාල්තුමන් වෙත ඉදිරිපත් කරන බව මෙයින් දන්වා සිටිමි.

බෝපිටිය,
මතුගම,
73. 6. 13 දිනදීය.

වැ. සෝ. ධම්මවඩීන.

6–854—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

**ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව**

අනුමත ව්‍යාපෘති සඳහා විශේෂ ආධාර දීමනා—1973

පර්යේෂණ කටයුතු සඳහා විශේෂ ආධාර ප්‍රධානය කිරීම පිණිස සලකා බලනු වස් විද්‍යාත්මක පර්යේෂණවල නිරතව සිටින පුද්ගලයන්ගෙන්, විශ්වවිද්‍යාලවලින්, පර්යේෂණ ආයතනවලින් හා අනෙක් සංවිධානවලින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

ආධාර දීම පිණිස පහත සඳහන් කාර්ය ක්ෂේත්‍ර සලකා බලනු ඇත :—

(අ) කෘෂිකාර්මික විද්‍යා
(ආ) ඉංජිනේරු විද්‍යා
(ඇ) වෛද්‍ය විද්‍යා
(ඈ) පරිසර විද්‍යා
(ඉ) ජෛව විද්‍යා
(ඊ) රසායන විද්‍යා
(උ) භෞතික විද්‍යා
(ඌ) ගණිත විද්‍යා
(ඍ) සමාජයීය විද්‍යා

ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවේ සහකාර ලේකම්ගෙන් ලබාගත හැකි විශේෂ ආකෘති පත්‍ර මගින් පිටපත් දෙකකින් යුතුව ඉල්ලුම් පත් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත් ආකෘති පත්‍ර ඉල්ලා එවන විට මුද්දර ගැසූ, ලිපිනය ලියන ලද 9" × 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද ඒ සමග එවිය යුතුය. මේ කාර්යය සඳහා විදේශ විනිමය නැත.

රටට ආර්ථික වශයෙන් හා සමාජයීය වශයෙන් වහාම ප්‍රයෝජනවත් වන පර්යේෂණ වැඩි දියුණු කිරීමේ ද ඒ පර්යේෂණ ප්‍රශ්න දෙස බහු විෂයාත්මක හා අන්තර් සංවිධානමය ආකල්පයකින් බැලීම දිරි ගැන්වීමේද අරමුණ ඇතිව, පහත සඳහන් පර්යේෂණ ව්‍යාපෘති සඳහා ඉල්ලුම් පත්, තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව විද්‍යාඥයන්ට ඇරයුම් කරයි. මේ ව්‍යාපෘති කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු වේ :

(1) වැල් දොඩම්වලට හා පැපොල්වලට වැළඳෙන වයිරස් රෝග මර්දනය කිරීම.
(2) කෘමිනාශක හා වල්පැළෑටි නාශක මිනිසා කෙරෙහි බලපාන අයුරු.
(3) කඩදාසි ද ඒ හා සම්බන්ධිත ද්‍රව්‍ය ද නිෂ්පාදනය කිරීම හේතු කොට ගෙන පරිසරය දූෂණය වීම සහ ඒ සම්බන්ධයෙන් ගත යුතු සුදුසු ප්‍රතිකර්ම.
(4) ගෘහ කර්මාන්තයක් වශයෙන් කෝජු නිෂ්පාදනය කිරීම.
(5) වර්ෂාපතනය නිසා වියළි කලාපයේ භූගත ජලය ප්‍රතිපූර්ණය වීම පිළිබඳ අධ්‍යයන.
(6) ධාන්‍ය වර්ග ගබඩා කිරීම හා සංරක්ෂණය කිරීම.
(7) පලතුරු හා එළවළු ගබඩා කිරීම හා සංරක්ෂණය කිරීම.
(8) දහයියාවල "ලයිපේස්" ක්‍රියාකාරිත්වය සහ එය අක්‍රිය කිරීම.

ඉල්ලුම් පත්, 1973 ජූලි මස 31 වන දින හෝ ඊට පෙර පහත අත්සන් කරන නිලධාරියාට ලැබෙන ලෙස ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

ලේකම් ජනරාල්.

47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 7.

6–855—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

පාවිච්චි කරන ලද භාණ්ඩ බෙදා හැරීම

රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා රජයේ අනිත් ආයතනවලට බෙදා හැරීම සඳහා පාවිච්චි කරන ලද ටයර්, ටියුබ්, බැටරි, තෙල් ඉසිනයන්, බෝට්ටු ඇන්ජින්, ආවුද ආදී භාණ්ඩ මෙම ආයතනයේ තිබේ.

මෙම භාණ්ඩ අවශ්‍ය ආයතන 1973. 7. 5 වැනි දිනට ප්‍රථම කාර්යාලීය වේලාවන් තුළදී එය පරීක්ෂා කර බලා විස්තරාත්මක ලැයිස්තුවක් මගෙන් ලබා ගත හැක.

ජේ. කේ. පී. ප්‍රනාන්දු,
කෘෂිකර්ම ඉංජිනේරු (නිෂ්පාදන).

වැඩපළ හා යන්ත්‍රාගාරය,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 5, දුර කථනය : 86359
1973. 6. 22.

6–861—73.06.22 දින අංක 65 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උප ලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජුනි | 73.06.14 | බ්‍රහස්පතින්ද | ... | 73.06.06 | බදාදා | දවල් | 12.00 |
| | 73.06.22 | සිකුරාද | ... | 73.06.13 | බදාදා | දවල් | 12.00 |
| | 73.06.29 | සිකුරාද | ... | 73.06.20 | බදාදා | දවල් | 12.00 |
| ජූලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.27 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.04 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදාදා | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාදා | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... | 73.08.22 | බදාදා | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | බදාදා | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... | 73.09.19 | බදාදා | දවල් | 12.00 |

ආර්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.